# ශ්‍රී ලංකා රේගුව

# ප්‍රසම්පාදන දැන්වීම

පලාලි ගුවන් තොටුපලේ රාජකාරියේ නියුතු රේගු නිලධාරින්ගේ (පිරිමි) විවේකාගාර පහසුකම් සඳහා පහත පහසුකම් වලින් සමන්විත ගොඩනැගිල්ලක් වසර දෙකක කාලයක් සඳහා මාසික කුලී පදනම මත ලබා ගැනිම සඳහා මිල ගණන් කැඳවනු ලැබේ.

එම ගොඩනැගිල්ල පහත අංගෝපාංගයන්ගෙන් සමන්විත විය යුතුය.

1. කාමර 06 කින් සමන්විත නේවාසිකාගාර ගොඩනැගිල්ලක් වීම.
2. පලාලි ගුවන් තොටුපලේ සිට කි.මී.25 ක් ඇතුලත හෝ ඊට ආසන්නව ප්‍රධාන පාරකට මුහුණ ලා නේවාසික ප්‍රදේශයක පිහිටා තිබිය යුතුය.
3. ටයිල් ඇතිරූ ගෙබිමක් හා සිවිලිමක් සහිත සහ යාබද වැසිකිලි පහසුකම් සහිත නාන කාමර ටයිල් වලින් සකස් කළ ගොඩනැගිල්ලක් විය යුතුය.
4. කාමර සියල්ලටම සහ ආලින්දයට විදුලිපංකා සහ වායුසමීකරණ පහසුකම් තිබීම.
5. ආලින්දයට සෝපාවක් සැපයිය යුතුය.
6. විදුලිබල සහ ජල පහසුකම් සහිත වීම.
7. ගොඩනැගිල්ල වටා ආරක්ෂිත වැටක් හෝ වට තාප්පයක් සමඟ ගේට්ටු සහිත වීම.
8. විවේකාගාරයේ එක් එක් කාමරය සඳහා තනි ඇඳන් 02 ක්, රෙදි රාක්ක 02 ක්, කාර්යාල මේසයක් සහ පුටුවක්,දොර දෙකේ අල්මාරියක් සැපයිය යුතුය.
9. නේවාසිකාගාරයේ මුළුතැන්ගෙය සඳහා A medium size double door refrigerator, A Gas cooker with at least two burners, Rice Cooker, An Electric blender, A Microwave oven An Electric kettle, සැපයිය යුතු අතර භාණ්ඩ ක්‍රියාකාරී තත්ත්වයේ පැවතිය යුතුය.
10. නිවස සඳහා සම්බන්ධතාවය සහිත රූපවාහිනී යන්ත්‍රයක්, (A Television with a connection) රෙදි සෝදන යන්ත්‍රයක් ( A washing Machine) සැපයිය යුතුය.
11. අවම වශයෙන් වාහන 06 ක් වත් නවතා තැබිය හැකි කොන්ක්‍රීට් කරන ලද බිමක් තිබිය යුතුය.

<u>**කොන්දේසි**</u>

1. මිල ගණන් ඉදිරිපත් කරන භූමිය හා ගොඩනැගිල්ල යම් ආරවුලකට හෝ අධිකරණ ක්‍රියාවලියකට අදාල වන්නක් නොවිය යුතුය.
2. මිල ගණන් සමඟ පහත ලේඛන/තොරතුරු සපයා තිබිය යුතුය.
   - i. ගොඩනැගිල්ලේ අයිතිය තහවුරු කිරීම සඳහා ඔප්පුවේ සහතික කළ පිටපතක් /මිල ගණන් ඉදිරිපත් කරන්නා භූමියේ හා ගොඩනැගිල්ලේ අයිතිකරු නොවේ නම් අතුරු බදු දීමට නීතිමය ප්‍රතිපාදන සහිත බදු ඔප්පුවේ පිටපතක් ඉදිරිපත් කළ යුතුය.
   - ii. ගොඩනැගිල්ලේ බිම් සැලැස්ම
   - iii. අදාල පළාත් පාලන ආයතනය විසින් නිකුත් කළ අනුකූලතා සහතිකය හෝ ගොඩනැගිල්ල භාවිතයට සුදුසු තත්ත්වයේ ගොඩනැගිල්ල පවතින බවට සුදුසුකම්ලත් තාක්ෂණික නිළධාරියෙකුගෙන් ලබා ගන්නා ලද සහතිකයක්
   - iv. ගොඩනැගිල්ලේ පවතින පහසුකම්
   - v. මාසික කුලිය (රුපියල්)
   - vi. ගෘහ භාණ්ඩ ලයිස්තුව
   - **vii.** ආසන්නතම පෙර මාසයේ හිඟ රහිතව නිරවුල් කරන ලද පාරිභෝගික බිල්වල පිටපත්.

**3.** ගිවිසුම් ගත කාල සීමාවට අදාළ ව ජල සහ විදුලිය ඇතුලත් පාරිභෝගික බිල්පත් ශ්‍රී ලංකා රේගුව මඟින් නිරවුල් කරනු ඇත.

**4.** බදුකරු විසින් පළාත් පාලන ආයතනය වෙත ගෙවිය යුතු වරිපනම් බදු ගාස්තු දැරිය යුතු වේ.

**5.** කොන්ත්‍රාත් ප්‍රදානයෙන් දින 21 ක් ඇතුලත බදු/කුලී ගිවිසුම් සඳහා එලඹීමත් ඊට අදාළ වියදම් බදුකරු විසින් දැරීය යුතු වේ.

**6.** ගිවිසුම්ගත කාල සීමා සඳහා ගොඩනැගිල්ලේ සහ රථගාලේ පරිහරණ අයිතිය ශ්‍රී ලංකා රේගුව සතුව පැවතිය යුතු අතර ගොඩනැගිල්ල රථගාල හැර භූමිය බදුකරු විසින් මැනවින් නඩත්තු කර පවත්වා ගෙන යාම බදුකරුගේ වගකීමයි.

**7.** සියළුම අළුත්වැඩියා කටයුතු බදුකරු විසින් ඉටු කළ යුතුය.

**8.** ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන මිල ගණන් බහා මුද්‍රා ලබන ලද කවරයේ වම් පස ඉහල කෙලවරේ පලාලි ගුවන් තොටුපලේ රාජකාරියේ නියුතු රේගු ලධාරීන්ගේ විවේකාගාර සඳහා (පිරිමි) මිල ගණන් ඉදිරිපත් කිරීම ලෙස සඳහන් කළ යුතුය.

9. මුද්‍රා තබන ලද මිල ගණන් රේගු අධ්‍යක්ෂ (සේවා සැපයුම් අංශය),6 වන මහල, රේගු මන්දිරය, අංක 40, කෙළින්වීදිය, කොළඹ 11යන ලිපිනයට 2026.06.05 දින ප.ව.2.00 ට ප්‍රථම ලැබෙන සේ ලියා පදිංචි තැපැලෙන් යොමු කිරීමට හෝ නොඑසේනම් රේගු මන්දිරයේ 6 වන මහලේ පිහිටි සේවා සැපයුම් අංශයේ තබා ඇති ප්‍රසම්පාදන පෙට්ටියට බහාලීමට කටයුතු කළ යුතුය.

10. මිල ගණන් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලබන අතර එම අවස්ථාව සඳහා ගොඩනැගිලි අයිතිකරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගී විය හැකිය.

11. මිල ගණන් ඉදිරිපත් කළ ගොඩනැගිලිවල යෝග්‍යතාවය තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයින්, රේගු අධ්‍යක්ෂ සේවා සැපයුම් හෝ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ (සේවා සැපයුම්) ස්ථානීය පරීක්ෂාවකින් අනතුරුව තීරණය කෙරෙනු ඇත.

12. ඉදිරිපත් කරන මිල ගණන් පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ බලය රේගු අධ්‍යක්ෂ ජනරාල් සතු වේ.

13. වැඩිදුර තොරතුරු අංක 011 – 2221680 දුරකතන මාර්ගයෙන් රේගු අධ්‍යක්ෂ (සේවා සැපයුම්) වෙතින් ලබා ගත හැකිය.

සභාපති,

දෙපාර්තමේන්තු(සුළු පරිමාණ) ප්‍රසම්පාදන කමිටුව
ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව,
රේගු මූලස්ථානය, අංක 40,
කෙළින්වීදිය,කොළඹ 11